**ශීර්ෂය 114 - ප්‍රවාහන අමාත්‍යාංශය**

--------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ප්‍රවාහන අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) පසුගිය වර්ෂයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් භාණ්ඩාගාරයට කරන ලද සෘජු ගෙවීම්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවීම හේතුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන හා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අතර රු.115,854,907 ක වෙනසක් නිරීක්ෂණය විය. | දෝෂයක් හෝ වරදක් නොවන අතර 2021 වර්ෂය අවසානයේ ආසියානු බැංකු සෘජු ගෙවීම් **(Direct Payment)** භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව එම වසර සඳහා ගිණුම්ගත කර නොතිබීම හා 2020 වර්ෂය අවසානයේදී සිදුකරන ලද සෘජු ගෙවීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා ගිණුම්ගත කිරීම. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ව්‍යාපෘති කාර්යාලය විසින් තම රේඛීය අමාත්‍යාංශය සමඟ මූල්‍ය වර්ෂය අවසාන දිනට වියදම් හා ණය වාර්තා පිළිබඳ සැසඳීමක් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනය වු රු.668,500,000 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.389,795,882 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46 සිට සියයට 96 පරාසයක් අතර පැවතුණි. | අමාත්‍ය කාර්යාලය සඳහා අනුමත කාර්යමණ්ඩලය වඩා තත්‍ය කාර්යමණ්ඩලය අඩු සංඛ්‍යාවක් පැවතීම අමාත්‍යාංශවල වියදම් නැවත සමාලෝචනයට ලක්කිරීම මගින් වියදම් සීමා කර ගැනීම හා 114-2-3-02-1509 වැය විෂයේ ඉතිරිවීම් සඳහා රටේ පැවති කොවිඩ් වසංගතය මත පාසල් වසා තැබීම මත සාමාජීය සුබසාධනය ප්‍රමුඛ කරගත් ව්‍යාපෘති(සිසු සැරිය) සඳහා ගෙවීම් නොකිරීමෙන් ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු විය. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන අයවැය ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ආ) | වැය විෂයය 114-2-3-11-2506 යටිතල පහසුකම් සංවර්ධන යටතේ සහසර බස් නවීකරණ ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.400,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබු අතර එයින් මු.රෙ.66 මඟින් රු.118,882,612 ක් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කල පසුවද අදාල ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව අවම මට්ටමක පැවතීම හේතුවෙන් රු.209,892,341 ක ප්‍රතිපාදන තවදුරටත් ඉතිරිව තිබුණි. | "රාජ්‍ය වියදම් සමාලෝචනය" මැයෙන් මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ 2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 02 ඡේදයේ (i) හා (ii) උපදෙස් ප්‍රකාරව මෙම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඉතිරි විය. | -එම- |
| (ඇ) | කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව යටතේ රු.මි.3200 ක්ද දේශිය අරමුදල් ප්‍රතිපාදන යටතේ රු.මි.235 ක් ද වෙන්කර තිබුණද දේශිය අරමුදල් ප්‍රභවය යටතේ වැයකිරීම රු.මි.96 ක් හෙවත් 41% ක තරම් ප්‍රමාණයක් වී තිබුණි. එසේම ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ වු ප්‍රතිපාදනයෙන් වැයකල මුදල | 114-2-4-10-2104-12<br>2021 වියදම් වලට අනුව සත්‍ය වියදම අඩුවීම නිසා මෙම ඉතිරිය ඇතිවන ලදී.<br><br>114-2-4-10-2104-17<br>2021 ගෙවිය යුතු බදු ප්‍රමාණය අඩුවීම, පුහුණු හා සංවර්ධන වියදම් හා ඉඩම් පවරා ගැනීම් අඩුවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.මි.2012 ක් පමණක් වීම හේතුවෙන් හා සමස්ථ ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඌන උපයෝජනය හේතුවෙන් ප්‍රයාපන ගාස්තු ලෙස රු.මි.83 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවා තිබුණි. | 114-2-4-11-2104-17 ගිවිසුම් වලට එළඹීම ප්‍රමාද වීම නිසා විදේශ අරමුදල් වලින් කරන ලද ගෙවීම් 2021 වර්ෂය තුල සිදු නොවිය. | |
| **(ඇ)** | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේ රු.මි.350 ක්ද දේශීය අරමුදල් ප්‍රභවය යටතේ රු.මි.1578 ක්ද වෙන්කර තිබුණද ව්‍යාපෘතියේ දුම්රිය මාර්ග දෙපස පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ කාර්ය සාධනය අවම මට්ටමක පැවතුණි. මේ හේතුවෙන් දේශීය අරමුදල් මගින් වූ උපයෝජනය රු.මි.264 ක් හෙවත් එම ප්‍රතිපාදනයෙන් සියයට 17 ක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | -එම- |
| **(ඉ)** | 2-2103-11 වැය විෂයය යටතේ දුම්රිය මෙහෙයුම් සම්බන්ධ තොරතුරු ලබාදීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිය සඳහා රු.6,362,730 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය වසර 2කින් අවසන් කළයුතු වුවත් එය ක්‍රියාත්මක වීම ප්‍රමාද වී තිබුණි. පසුව කොළඹ තදාසන්න ව්‍යාපෘතියෙන් මෙම ව්‍යාපෘතියේ අරමුණු ආවරණය වන බව නිරීක්ෂණය වීම මත ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජනා වී තිබියදීත් 2021 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට රු.21,000,000 ක් ප්‍රතිපාදන කර තිබූ අතර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේ මුල සිට අකර්මන්‍ය ලෙස පැවතුනු අතර කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය යටතේ වන REIP තුලින් දුම්රිය ධාවන තොරතුරු ලබා ගත හැකි බව දන්වන හෙයින් , මෙම ව්‍යාපෘතිය තවදුරටත් ආරක්ෂක අමාත්‍යාංශයේ සංවර්ධන හා පර්යේෂණ ආයතනය හරහා ඉටු නොකරන ලදී. ඒ සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස 2021.07.06 දිනැති ලිපිය මගින් කමිටුවක් පත් කරන ලදී.<br>මේ තත්ත්වය මත ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | අවශ්‍යතා නිසිපරිදි හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කලයුතු වීම. |

### 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 සැප්තැම්බර් 01 දින වැඩ තහනමට ලක් වී සිටි නිලධාරිනියකගෙන් අයවීමට පැවති රු.121,945 ක ණය ශේෂයක් වසර 09 කට වැඩි කාලයක් ගත වී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල ගෙවීම සඳහා ලේකම්තුමා විසින් මාස 06 ක සහන කාලයක් ලබා දී ඇත. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවය අතහැර ගොස් සිටි නිලධාරීන් තිදෙනෙකුගෙන් වර්ෂ 6ත් 9ත් අතර කාලයක සිට අයවිය යුතු රු.398,702 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | -එම- |
| (ඇ) | 2020 මාර්තු 01 දින විශ්‍රාම ගොස් තිබූ නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.48,515 ක අපදා ණය ශේෂයක් වර්ෂ 1½ කට වැඩි කාලයක් ගත වී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරිනිය මිය ගොස් ඇති අතර ඇයගේ වැන්දඹු හා අනත්දරු අංක ලබා ගෙන විශ්‍රාම ගොනුව සකස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | -එම- |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i)** මුදල් රෙගුලාසි අංක **571 (ඇ)** | කල් ඉකුත් වූ රු.10,000 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| **(ii)** මුදල් රෙගුලාසි අංක **880** | ඇප තැබිය යුතු සියළුම නිලධාරීන් හඳුනා ගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඇප ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැම්පත් කලයුතු නිළධාරීන් හඳුනාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැම්පත් කලයුතු වීම සහ ඇප ලේඛනයක් නඩත්තු කලයුතු වීම. |

**2.4 බැරකම් සඳහා එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 114-2-3-9-2506 වැය විෂය යටතේ රු.37,439,339 කින් වියදමක් සම්බන්ධව ගිණුම් වර්ෂයට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළැඹ තිබුනේ 114-2-3-9 2506 වැය විෂයයේ පමණක් වන අතර ඉතිරි වැය විෂයයන් වල ප්‍රතිපාදන සීමාව තුළ බැරකම් වලට එළැඹ තිබේ. | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රතිපාදන සීමාව තුල වියදම් දැරීමට කටයුතු කලයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

3.1 **අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිහි කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| <u>විදේශ අධාර යෙදවූ ව්‍යාපෘති</u><br>කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මඟින් කොළඹ තදාසන්න දුම්රිය සේවයේ වැඩිදියුණුව සඳහා පිළියෙල කල ශක්‍යතා අධ්‍යන වාර්තාව හා විස්තරාත්මත සැලසුම් වාර්තා ප්‍රවාහන අමාත්‍යාංශය වෙත 2021 මාර්තු මස වන විට ලබා දී තිබුණද එම ශක්‍යතා අධ්‍යන වාර්තා වල නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක නොකොට වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට මෙම ශක්‍යතා අධ්‍යන වාර්තා සකස් කිරීම සඳහා රු.1,446,952,381 ක්ද ආසියානු සංවර්ධන බැංකුවට ණය පොළී ලෙස රු.69,345,336 ක්ද වැය කර තිබුණි. තවද ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණය මුදල් වෙනුවෙන් පළමු වාරිකය 2022 මාර්තු 15 වන දින ඇ.ඩො.275,000 ක් ගෙවීමට නියමිතව තිබුණි. | 2021.06.10 දින ගරු අග්‍රාමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාවකදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකු අරමුදල යොදාගැනීමටත් යෝජනා විය. | ලබාගත් ණය මුදල් ආර්ථිකයේ වර්ධනය සඳහා යොදාගැනීමට අවශ්‍ය කටයුතු අප්‍රමාදව සම්පාදනය කල යුතු වීම. |

## 3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති කාර්යසාධනය

### (අ) කුරුණෑගල හබරණ හරහා දුම්රිය මාර්ගය - ව්‍යාපෘතිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කුරුණෑගල දඹුල්ල හරහා හබරණ දක්වා යෝජිත දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල දේශිය අරමුදල් යටතේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් රු.1,032,757,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ මුළු ප්‍රතිපාදනයෙන් 46% ක් පමණක් වැය කර සියයට 54 ක් වූ රු.555,906,008 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මූලික ඉංජිනේරු වැඩ මැනුම් ඩ්‍රෝන තාක්ෂණ යොදා ගෙන සිදු කිරීමද, 2 වන වගන්තිය යටතේ මිනින්දෝරු මැනුම් දිරි දීමනාවලට පමණක් සීමා වන පරිදි අඩුකර ගෙන ගෙවීමද , ජල විද්‍යා අධ්‍යනය කටයුතු හා පස් පරීක්ෂන කටයුතු ව්‍යාපෘති යෝජකයින් විසින් රජයට වැය බරක් නොවන ලෙස ඉටු කිරීම ද නිසා ප්‍රතිපාදන ඉතිරියක් සිදු වූ අතර, එම ඉතිරිය හඳුනාගත් වහාම ප්‍රතිපාදන අවශ්‍ය වූ වෙනත් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරයේ එකගතාවය මත සිදුකර ඇත. | අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂමව අදාල කාර්ය සඳහා යෙදවිය යුතු අතර සාර්ථකව නිමකල හැකි වෙනත් රජයේ ව්‍යාපෘතියකට එම ප්‍රතිපාදන යෙදවීම. |
| (ii) | මෙම ව්‍යාපෘතිය මඟින් 2024 වර්ෂය වන විට ඉඩම් කැබලි 4090ක් පවරා ගෙන වන්දි ගෙවීම් අවසන් කලයුතු වුවත් 2022 ජනවාරි 24 දින වනවිට වන්දි ගෙවා අවසන් කර තිබුණේ ඉන් සියයට 3 ක ප්‍රමාණයක් වූ ඉඩම් කට්ටි 133ක් පමණි. | වන්දි පරීක්ෂණ පැවැත්වීම සඳහා ඉඩම්හිමියන් කලටවේලාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඔප්පු හා අදාල ලේඛන ඉදිරිපත් කළ යුතුව ඇතත් COVID තත්ත්වය මත කාර්යාල වසා තැබීමට සිදුවිය. සංචරණ සීමා නිසා ලේඛන ඉදිරිපත් කිරීම්වල ප්‍රමාදය නිසා වන්දි පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය කාර්යක්ෂමව හා ප්‍රමාදයකින් තොරව ඉටුකල යුතු වීම. |
| (iii) | 2010 වර්ෂයේදී ක්‍රියාකාරි ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වී තිබූ කුරුණෑගල හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය 2024 වර්ෂය වන විට ඉඩම් කැබලි 4090 ක් අත්පත් කරගෙන වන්දි ගෙවා අවසන් කර භූමිය හිස් කර තිබුණි. එහෙත් ව්‍යාපෘතියේ අරමුණ වූ කුරුණෑගල සිට හබරණට දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා 2022 වර්ෂය වන විට අදාල ආයෝජකයින් හෝ අරමුදල් ලබා ගැනීමේ මූලාශ්‍ර හඳුනාගෙන නොතිබීමත් 2022 පෙබරවාරි 11 දින වන විටත් මූල්‍ය ගිවිසුමකට එළඹී නොතිබීමත් මත දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් අවිනිශ්චිත තත්වයක පැවතුණි. | 2018 වර්ෂයේදී චීන සමාගමක් සමග වානිජ ගිවිසුම් අත්සන් කර ඇති අතර, 2022 වර්ෂයේදී මූල්‍ය ගිවිසුම්ගතවීමේ අවශ්‍යතාව ප්‍රවාහන අමාත්‍යතුමිය විසින් මුදල් අමාත්‍යතුමා වෙත ලිඛිතව දන්වා ඇති. ඒ අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අවශ්‍ය විස්තර ලබාගෙන ඉදිරි කටයුතු කරමින් පවතී. | අදාල ව්‍යාපෘතිය ඉටුකිරීමට අදාල අයෝජකයින් සමඟ ගිවිසුම්ගත විය යුතුවීම. |

### 3.3 සහසර ව්‍යාපෘතියේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2021 පෙබරවාරි 31 දින දක්වා සහසර ව්‍යාපෘතිය සඳහා රු.මි.194.94 ක් වැයකර තිබූ අතර එය ව්‍යාපෘති කාලයෙන් වසර තුනක කාලයක් ගත වන අවස්ථාවේදීත් සමස්ථ ව්‍යාපෘති ඇස්තමේන්තුව වූ රු.මිලියන 26,860 න් සියයට 0.72 ක් විය. එසේම දරණ ලද මුළු වියදමෙන් රු.මි.150 ක් ව්‍යාපෘති පරිපාලන වියදම් සඳහාද ව්‍යාපෘතියේ අරමුණු වෙනුවෙන් වූ G.P.S යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු.මි.28 ක්ද වැයකර තිබුණි. | 2018 සැප්තැම්බර් මාසය දක්වා ව්‍යාපෘතියට බඳවා ගෙන තිබුණේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරු පමණක් වන අතර සහසර ව්‍යාපෘතියේ අරමුණු රාමුව හා වැඩපිළිවෙල තීරණය වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත්තේ 2018 ඔක්තෝබර් මාසයේදීය.ඒ අනුව 2018 වසර සඳහා වෙන් කරන ලද රු.මි.500 ක ප්‍රතිපාදන වැය කිරීමට නොහැකි විය. 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරණ ජාතික අයවැය චක්‍රලේඛය පදනම් කරගෙන සියලු ප්‍රසම්පාදන අත්හිටුවීම හේතුවෙන් 2019 වර්ෂයේ වැය වී ඇත්තේ මෙහෙයුම් වියදම් පමණි. | ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන කාර්යක්ෂමව යෙදවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුවීම සහ ප්‍රතිපාදන නිසි පරිදි නොයෙදවීම තුළ වෙනත් ව්‍යාපෘතියකට යෙදවීමට තිබූ අවස්ථාව අහිමිවීමේ අවස්ථාවන් අවම කලයුතු වීම. |
| (ආ) | අංක 2016/1 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 'සහසර' ව්‍යාපෘතිය පාලන ඒකකයට සහාය දීම පිණිස අදාල දැනුම හා පළපුරුද්ද සහිත ආයතන වල කාර්ය මණ්ඩලයක සේවය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිව ලැබී තිබුණද විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට 2022 පෙබරවාරි 21 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 47 දෙනෙකු වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 16 ක්ව පැවතුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ MCC (මිලේනියම් චැලෙන්ජ් කොපරේෂන්) ගිවිසුම යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 50ක ණය ප්‍රතිපාදන ලබා දීමට එකඟව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ඒහෙත් පසුව MCC (මිලේනියම් චැලෙන්ජ් කොපරේෂන්) ගිවිසුම අත්සන් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරගැනීමේ ක්‍රමවේදයක් හඳුනාගැනීමකින් තොරව | පිළිතුරු ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා විධිමත් පරිදි අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කරගතයුතු වීම. |

ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුල විදේශ ණය හෝ ප්‍රදාන යටතේ ලබාගැනීමට අපේක්ෂිත විදේශීය ආයෝජන ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජන දේශීය අරමුදල් හරහා සිදු කිරීමට යාම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු වල අවිනිශ්චිතභාවයක් පැන නැගී තිබු බව නිරීක්ෂණය විය.

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දිනට වෙනත් ආයතන හා අමාත්‍යාංශය භාරයේ පවතින වාහන 04 ක් විධිමත් පරිදි මුදාහැරීමට හෝ එම වාහන නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර අමාත්‍යාංශය විෂය පථය මාරු වන අවස්ථා වලදී අමාත්‍ය කාර්යමණ්ඩලය වෙත මුදා හරින ලද වාහනද නිසි පරිදි නැවත භාරදීමක් ද සිදු වී නොතිබුණි. | මෙම වාහන වෙනත් අමාත්‍යාංශ වෙත රැගෙන ගිය පසු නැවත මෙම අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙස කිහිපවිටකදීම ලිපි යොමු කල නමුත් අදාල වාහන භාර දීමට කටයුතු කර නොමැත. | වාහන විධිමත් පරිදි මුදා හැරීමට හෝ පවරාගැනීමට කටයුතු කළයුතුවීම. |
| (ආ) | අමාත්‍යාංශය විසින් විධිමත්ව පවරා ගැනීමකින් තොරව දිගු කාලයක් භාවිතා කල වාහන 02 ක් අපහරණය කලයුතු මට්ටමේ පැවතියද එසේ අපහරණය නොකර 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම අමාත්‍යාංශය නමින් පවරාගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන දැනට ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ ඇති මෙම රථ 02 අමාත්‍යාංශය වෙත පවරාගෙන අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වාහන විධිමත්ව පවරාගෙන අපහරණ කටයුතු නිසි පරිදි සිදුකළ යුතුවීම. |

**3.5 හානි පාඩු පරීක්ෂාව**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 109 යටතේ පොතෙන් කපාහැරීම් හා අයකර ගැනීම් අවස්ථා 05 ක් සම්බන්ධයෙන් වූ රු.299,521 ක අලාභයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභයන් 03 ක් සම්බන්ධයෙන් ගෙවීමට ඉතිරි රු,190,663 ක ශේෂය සම්බන්ධයෙන් අදාල රියදුරන් වෙත දන්වා ඇති අතර ඒ සඳහා ප්‍රතිචාර නොලදහොත් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නියමිත අතර අනතුරු 02 ක් සම්බන්ධයෙන් වූ රු,108,858 ක අලාභය සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරමින් පවතී. | විධිමත් පරිදි හානි පියවා ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අනතුරු වලට ලක්වූ වාහන 04 ක අලාභයන් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම අනතුරු 04 සම්බන්ධව ඇස්තමේන්තු කරන ලද අලාභය රු.6,382,870 කි. | නිසි පරිදි හානි හා පාඩු ගිණුම් ගතකල යුතු වීම. |
| (ඇ) | හිටපු අමාත්‍යවරයකුගේ මාධ්‍ය ලේකම් වෙත අමාත්‍යාංශයෙන් ලිඛිතව ලබා දී තිබු Asus vivo Book 178 Gen වර්ගයේ රු.170,000 ක් වන ලැප්ටොප් පරිගණකය ඔහු භාරයේ තිබෙන අවස්ථාවේ 2021 ජුලි 9 දින සොරකමක් සිදු වී තිබුණි. මෙම අලාභය සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරික්ෂණ 2022 මාර්තු 28 දින වන විටත් සිදුව නොතිබූ අතර අදාල අලාභයන් අයකර ගැනීමටද අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | හිටපු අමාත්‍ය වරයාගේ මාධ්‍ය ලේකම්ගේ භාරයේ තිබූ අස්ථාන ගතවී ඇති ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු තවමත් සිදුකරමින් පවතින අතර කඩිනමින් පරීක්ෂණ අවසන් කර වාර්තාව ලබාදීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි පරිදි අප්‍රමාදව පරීක්ෂණ කටයුතු අවසන් කළයුතු වීම සහ නිසි පරිදි හානි හා පාඩු අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2030 තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අමාත්‍යාංශය විසින් අදාළ ඉලක්කයන් හඳුනාගැනීමට හා ඒවා මැනීමට අවශ්‍ය නිර්ණායක හඳුනාගැනීමට තවදුරටත් කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී උක්ත අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලදී. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කලයුතු වීම හා දත්ත පදනමක් ඇති කරගත යුතුවීම. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්යමණ්ඩලය පරීක්ෂා කිරීමේදී තනතුරු 07 ක පුරප්පාඩු 13 ක් ද එක් තනතුරක අතිරික්තතා 4 ක්ද පැවතුණි. විගණනය සිදුකල 2022 පෙබරවාරි 28 දිනට ඉහත තත්වය වෙනස් වී තිබූ අතර සංවර්ධන නිලධාරී නව බඳවා ගැනීම් අනුව 39 දෙනෙකු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබීම හේතුවෙන් තනතුරු 8 ක පුරප්පාඩු 9 ක්ද තනතුරු තුනක අතිරික්තතා 43 ක්ද ඇති වී තිබුණි. | අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු පිළිබඳ පත්වීම් බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන අතරම මේ වන විට ප්‍රවාහන අමාත්‍යාංශය හා මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී ඇති බැවින් විෂයය පථය පුළුල් වීම හේතුවෙන් අමාත්‍යාංශ අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට නියමිතය. | නව තනතුරු සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමටත් සේවා අවශ්‍යතා මත පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමටත් කටයුතු කළයුතු වීම. |
| (ආ) | ව්‍යාපෘතියේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ තනතුරු 5ක නිලධාරීන් 9 දෙනෙකුගේ පුරප්පාඩු හේතුවෙන් මෙම ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිසි පරිදි ප්‍රමාදයකින් තොරව සිදුකිරීමේදී විවිධ ගැටළු මතු වී තිබුණි. | රජයට පවතින මූල්‍ය දුෂ්කරතා නිසා අවම කාර්ය මණ්ඩලයකින් ව්‍යාපෘති කටයුතු පවත්වා ගෙන යන බවත්, නව බඳවා ගැනීම් නවතා ඇති බැවින්, පුරප්පාඩු පිරවීමට නොහැකි තත්ත්වයක් දැනට පවතින බවත්, ඒ සඳහා විකල්පයක් වශයෙන් දැනට රජය බඳවාගෙන ඇති සංවර්ධන නිලධාරීන් මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් කටයුතු සඳහා සහාය ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරු සමග කටයුතු කරන බවත් දන්වමි. | අවශ්‍ය කාර්ය මණ්ඩලයක් පත්කර ගෙන කාර්යක්ෂමව කටයුතු කලයුතු වීම. |